---

**පදියතලාව ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 07 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 21 දින සභාවේ සභාපතිතුමා වෙත යවන ලදි.

**1.2 මතය**

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව පදියතලාව ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම්**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම රු. 7,955,280 ක් වුවත්, ආදායම් හා වියදම් ගිණුමට අනුව රු. 7,674,181 ක් දක්වා තිබුණෙන් වර්ෂයේ මුළු වියදම රු. 281,099 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ආදායම් ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම රු. 6,636,366 වුවත් ආදායම් හා වියදම් ගිණුමට රු. 7,032,196 ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණෙන් වර්ෂයේ ආදායම රු. 395,830 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම වූ රු. 18,000 ක් සහ 2011 දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම වූ රු. 48,400 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාල රු. 27,250 උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල රු. 281,555 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණේ රු. 101,167 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ මුදල් ආදායම රු. 180,388 කින් අඩුවෙන් දක්ව තිබුණි. තවද 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 207,639 ක උසාවි දඩ මුදල ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) රු. 114,240 ක තොගයක් වර්ෂ ගණනාවක් තිස්සේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ නමුත් එවැනි තොගයක් භෞතික වශයෙන් නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

2013 අප්‍රේල් 11 දින වන විට විගණන විමසුම් 05 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 925,999 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 34,427,331 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 641,985 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 1,043,722 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | බදුකුලී | 1,453,700 | 1,003,675 | 225,995 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 535,000 | 355,700 | - |
| (iii) | සේවා සඳහා ගාස්තු | 422,000 | 441,550 | - |
| (iv) | වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 336,000 | 163,542 | - |
| (v) | වෙනත් ආදායම් | 154,000 | 149,657 | 24,115 |

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 207,639 |
| (ii) | මුද්දර ගාස්තු | 48,400 |

**2.2.3 හිඟ හිටි වෙනත් ආදායම් අයකර ගැනිම**

(අ) 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම්වල දක්වා තිබූ හිඟ හිටි වෙනත් ආදායම් (මස් කඩ බදු ) වශයෙන් රු. 24,115 ක් අයකර ගැනිමට ක්‍රියාමාර්ග සභාව ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 118,820 කඩ කාමර කුලී හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය